රාජකීය විද්‍යාලය - කොළඹ 07

13 වන ශ්‍රේණිය

ගිණුම්කරණය II

අනුකූලතා පරීක්ෂණය - 2020 අගෝස්තු

පැය 3යි විනාඩි 10යි

උපදෙස්:

- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුලත්ව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.
- අදාළ පෙර වැඩ පිළිතුරු පත්‍රය සමඟම අමුණන්න.
- වැඩසටහන්ගත කළ නොහැකි කැල්කියුලේටර භාවිතා කළ නැත.

1. පහත සඳහන් ශේෂ පිරික්සුම ලියාමා සහ සමාගමේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ වේ. මෙම සමාගම 8% VAT සඳහා ලියාපදිංචි වූ සමාගමක් වන අතර එහි මුල්‍ය වාර්තා 2020.06.20 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

	රු. 000	රු. 000
විකුණුම් පිරිවැය/ VAT සහිත විකුණුම්	50,000	97,200
බෙදාහැරීමේ පිරිවැය	7,500	
පරිපාලන වියදම්	5,000	
මූල්‍ය වියදම්	4,200	
අනෙකුත් ආදායම්		1,500
වෙළඳ ලැබිය යුතු දෑ/ වෙළඳ ගෙවිය යුතු දෑ	25,000	6,100
2020.03.31 දිනට නොගය	10,000	
ගැනුම් හා වියදම් සඳහා ගෙවූ VAT	5,400	
සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධනය		30,000
2019.04.01 දිනට දේපළ, පිරියත හා උපකරණ ධාරණ අගය	30,000	
මුදල් හා මුදල් සමාන දෑ	9,300	
2019.04.01 දිනට ප්‍රත්‍යගණන සංචිතය		800
2019.04.01 දිනට රඳවා ගත් ඉපැයුම්		2,600
10% බැංකු ණය		6,000
2019.04.01 දින ප්‍රතිඥහාර සඳහා වෙන් කිරීම		3,500
2019.04.01 ආදායම් බදු සඳහා ප්‍රතිපාදන		900
2019.04.01 දිනට වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම		1,400
ආදායම් බදු ගෙවීම්	1,500	
ගෙවූ ලාභාංශ	2,100	
	150,000	150,000

22 A/L අප් [papers grp]

අතිරේක තොරතුරු

අ) දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ.

	රු. '000	රු. '000
	2019.04.01 දිනට පිරිවැය/ප්‍රත්‍යාගණන අගය	2019.04.01 දිනට සමුච්චිත ක්ෂය
ඉඩම	15,000	-
ගොඩනැගිලි	10,000	5,000
මෝටර් රථ	12,000	4,000
ලී බඩු හා සවි කිරීම්	3,000	1,000
	40,000	10,000

Scanned with CamScanner

ආ) 2020.03.31 දිනට පරිපාලන හා බෙදාහැරීමේ වියදම් තුළ ඉදිරියට ගෙවූ වියදම් ඇතුලත් වන අතර ගෙවිය යුතු වියදම් ගැලපිය යුතුය.

	ඉදිරියට ගෙවූ වියදම් (රු. '000)	ගෙවිය යුතු වියදම් (රු. '000)
ප්‍රචාරණ	430	-
රක්ෂණ	-	710
විදුලිය	570	-
විකුණුම් කොමිස්	-	980

2020.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා මූල්‍ය වාර්තා පිළියෙළ කිරීමට පෙර පහත සඳහන් ගනුදෙනු හා සිද්ධීන්ද සැලකිල්ලට ගත යුතුය.

(i) 2020.03.31 දිනට රු. 3,000,000කට පිරිවැය වූ තොගයක් 2020.04.20 දින රු. 3,500,000 විකුණන ලද අතර ඒ සඳහා රු. 800,000 විකුණුම් වියදමක් ද දරණ ලදී.

(ii) 2020.03.31 දින ගොඩනැගිලි රු. 3,000,000කට ප්‍රත්‍යගණනය කළ අතර 2019.04.01 දින ඉඩම් රු. 15,500,000කට ප්‍රථම වතාවට ප්‍රත්‍යගණනය කරන ලදී.

(iii) 2019.04.01 ක දින කල් බඳු ගිවිසුමක් යටතේ මෝටර් රථයක් භාවිත අයිතිය ලබා ගන් අතර එහි කල් බඳු කාල සීමාව අවුරුදු 4ක් ලෙස හා ඵලදායී ජීව කාලය අවුරුදු 5ක් ලෙස තීරණය කරන ලදී. පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

අවට කල්බඳු ගෙවීම් වල වර්තාමන අගය	රු. 4,000,000
මුලික ගෙවීම	රු. 1,000,000
කල්බඳු වාරිකය	රු. 1,000,000
කල්බඳු පොලිය - පළමු වසර	රු. 400,000
දෙවන වසර	රු. 300,000

2020.03.31 දිනෙන් වර්ෂය තුළ ගෙවන ලද මුලික ගෙවීම හා පළමු කල් බඳු වාරිකය මූල්‍ය වියදම් තුළ ඇතුළත් වේ. මේ හැර වෙනත් කිසිදු සටහනක් කල්බඳු වත්කම් අන්පත් කරගැනීම සම්බන්ධයෙන් ගිණුම් ගතවී නොමැත. මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර කල්බඳු කාල සීමාවෙන් පසු කල්බඳු ගැනුම් තරුව හිමිවේ.

(iv) සමාගම වසරක වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණනු ලබන අතර පසුගිය වර්ෂය තුළදී සිදුකරන ලද විකුණුම් වෙනුවෙන් රු. 1,600,000ක වගකීම් සහතික වියදම් ප්‍රවර්ථන වර්ෂයේදී ගෙවා ඇත. මෙය බෙදාහැරීමේ පිරිවැය තුළ ඇතුළත් කර ඇත. ප්‍රවර්ථන වර්ෂය සඳහා රු. 2,500,000ක් ප්‍රතිඥාහාර සඳහා ප්‍රතිපාදනය කළ යුතුය.

(v) ගොඩනැගිලි, ලී බඩු හා සව් කිරීම (පිරිවැය මත) සරල මාර්ග ක්‍රමයට ඉ 10%ක් ක්ෂය කළ යුතුය. මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට 20% බැගින් ක්ෂය කළ යුතුය.

(vi) හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම වසර අග වළඳ ලැබිය යුතු දෑ ශේෂය මත 10% වනසේ ගැලපිය යුතුය.

(vii) රු. 1,800,000 ක්වූ ශුද්ධ වැටුප් ගෙවීම පරිපාලන වියදම් තුළ ඇතුළත් වේ. මේ හැර වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් නබා නැත. සේවක අර්ථ සාධක අරමුදලේ සේවක දායකත්වය දළ වැටුපෙන් 10% වන අතර සේවා දායකත්වය 15%ක් වේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3%ක් වෙන් කිරීමක් කළ යුතුය.

.22 A/L අපි [papers grp]

Scanned with CamScanner

(viii) පළමු මාස 6 සඳහා වූ ගෙවූ බැංකු ණය පොළිය ගෙවා ඇති අතර එය මූල්‍ය ව්‍යදම් තුළ ඇතුළත් වේ. ඉතිරි මාස 6 සඳහා පොළිය ගෙවිය යුතු අතර ණය වාරිකය ලෙස රු. 1,000,000ක් ඉදිරි වර්ෂය අවසානයේදී පියවිය යුතුය.

(ix) ප්‍රවර්ථන වර්ෂයේ ආදායම් බදු වගකීම රු. 2,500,000කට ඇස්තමේන්තු ගත කර ඇති අතර ප්‍රවර්ථන වර්ෂයේ ගෙවූ ආදායම් බදු ව්‍යදම් තුළ පෙර වර්ෂය සඳහා ගෙවූ රු. 1,000,000ක්ද ඇතුළත් වේ.

(x) අධ්‍යක්ෂවරුන් 1ක් රු. 100 බැගින් වූ කොටස් 10,000කට රඳවාගත් ඉපයීම් ප්‍රාග්ධනික කිරීමෙන් නිකුත් කර ඇත. රඳවාගත් ඉපයීමේ වලින් රු. 500,000ක් පොදු සංචිතයට මාරු කිරීමටද අධ්‍යක්ෂවරු තීරණය කරන ලදී.

අවශ්‍ය වන්නේ,

I. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලියාපා සහ සමාගමේ ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

II. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය

III. 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ලකුණු - 20)

2. (a) ජයපාල සහ සමාගම අත් සේදුම් බෙසම් (Wash Basin) නිෂ්පාදනය කරනු ලබන සමාගමකි. මෙම සමාගමේ නිෂ්පාදන දේපාර්තමේන්තු 3ක් හා සේවා දේපාර්තමේන්තුවක් ඇතුලත් වේ.
පහත සඳහන් තොරතුරු 2020 ජුනි මාසයේදී නිෂ්පාදනය කළ පාසල්වල සවි කිරීම සඳහා ඇති පාදයෙන් ක්‍රියා කළ හැකි අත් සේදුම් බේසම් සඳහා අදාළ වේ.

	වක්‍ර ද්‍රව්‍ය (රු.)	වක්‍ර ශ්‍රම (රු.)
යන්ත්‍ර දෙපාර්තමේන්තුව	120,000	100,000
එකලස් කිරීමේ දෙපාර්තමේන්තුව	100,000	50,000
නිමවුම් දෙපාර්තමේන්තුව	100,000	70,000
ගබඩා දෙපාර්තමේන්තුව	15,000	15,000

අනෙකුත් නිෂ්පාදන පොදු කාර්යය ව්‍යදම්

විදුලිය	රු. 96,000
වැඩ පරීක්ෂණ වැටුප	රු. 80,000
කම්හල් කුලිය	රු. 64,000
යන්ත්‍ර ක්ෂය	රු. 160,000

පහත සඳහන් තොරතුරු නිෂ්පාදන හා සේවා අංශ වලට අදාළ වේ.

	යන්ත්‍ර	එකලස්	නිමවුම්	ගබඩා
යන්ත්‍ර පිරිවැය	400,000	200,000	200,000	-
සේවක සංඛ්‍යාව	45	30	30	15
බිම් ප්‍රමාණය (වර්ග මීටර)	30,000	20,000	20,000	10,000
සෘජු ශ්‍රම වැය	2,000	3,000	2,000	-
යන්ත්‍ර පැය	5,000	4,000	5,000	-
ද්‍රව්‍ය අධියාචනා පත්‍ර සංඛ්‍යාව	50	100	150	-

ගබඩා දෙපාර්තමේන්තුවේ පොදු කාර්යය පිරිවැය ගබඩා අධියාචනා සංඛ්‍යාව පදනම් කර ගනිමින් නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර බෙදා හල යුතුය.

යන්ත්‍ර හා නිමවුම් දෙපාර්තමේන්තුවේ පොදු කාර්යය පිරිවැය යන්ත්‍ර පැය පදනම් මතද එකලස් කිරීමේ දෙපාර්තමේන්තුවේ පොදු කාර්යය පිරිවැය සෘජු ශ්‍රම පිරිවැය පදනම් මත බෙදාහැරිය යුතුය.

Scanned with CamScanner

එක අත් සේදුම් බෙසමක් සෑදීමට අවශ්‍ය කරන කාලය පහත දැක්වේ.

යන්ත්‍ර දෙපාර්තමේන්තුව	පැය 2
එකලස් කිරීමේ දෙපාර්තමේන්තුව	පැය 2
නිමවුම් දෙපාර්තමේන්තුව	පැය 1

අවශ්‍ය වන්නේ.

1) පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව
2) එක අත් සේදුම් බෙසමක් නිෂ්පාදනය කිරීමේ පොදු කාර්යය පිරිවැය

(ලකුණු - 10)

(b) ඉහත සඳහන් ව්‍යාපරයේ අත් සේදුම් බේසම් සෑදීම සඳහා අමුද්‍රව්‍ය බාහිර සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගනී. පහත සඳහන් තොරතුරු 2020 ජුනි මාසය තුලදී මිලදී ගන් අමුද්‍රව්‍ය පිළිබඳ වන අතර ව්‍යාපාර ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට තොග අගය කරයි.

ජුනි 1	ආරම්භක තොගය	2,000 kg	රු. 525 බැගින්
ජුනි 10	ලැබීම්	3,000 kg	රු. 600 බැගින්
ජුනි 19	නිකුත් කිරීම්	1,500 kg	
ජුනි 20	ලැබීම්	1,500 kg	රු. 550 බැගින්
ජුනි 29	නිකුත් කිරීම්	3,500 kg	

අමුද්‍රව්‍ය 2kgක් එක් අත් සේදීමේ බෙසමක් නිෂ්පාදනයට අවශ්‍ය වේ. ඇස්තමේන්තුගත නොරතුරු අනුව මෙම ව්‍යාපාරයේ මාසික උපරිම අමුද්‍රව්‍ය භාවිතය 5000kg වන අතර අවම අමුද්‍රව්‍ය භාවිතය මසකට ඒකක 2,000කි. උපරිම පොරොන්දු කාලය මාස 3ක් වන අතර අවම පොරොන්දු කාලය මාස 2කි. අමුද්‍රව්‍ය වල ආර්ථික ඇනවුම් ප්‍රමාණය 8000kg කි.

අවශ්‍ය වන්නේ.

1) යළි ඇනවුම් මට්ටම
2) අවම තොග මට්ටම
3) උපරිම තොග මට්ටම
4) සාපු ද්‍රව්‍ය පිරිවැය (එක් ඒකකයකට)
5) 2020 ජුනි 30 දිනට තොග පිරිවැය

(ලකුණු -5)

(c) පහත සඳහන් තොරතුරු ඉහත ව්‍යාපාරයේ 2020 ජුනි මස සේවක වැටුප් හා සම්බන්ධ වේ.

සේවක නම	සේවක ඛණ්ඩය	මූලික වැටුප (රු.)	සතියේ දිනවල වැඩකළ පැය ගණන	සතිඅන්ත දිනවල වැඩකළ පැය ගණන
අමල්	නිෂ්පාදන සේවක	32,000	172	20
නිමල්	නිෂ්පාදන සේවක	48,000	200	-
කමල්	පරිපාලන සේවක	40,000	180	30

අතිරේක තොරතුරු

(i) සාමාන්‍ය මසකට පැය 160ක් වැඩ කළ යුතුය. අතිකාල ගෙවීම් පහත පරිදි සිදු කළ යුතුය.
සතියේ දින - සාමාන්‍ය පැයක වැටුප මෙන් 1 1/2
සති අන්ත දින - සාමාන්‍ය පැයක වැටුප මෙන් දෙගුණයක්

(ii) සෑම සේවකයෙකුගෙන්ම සුබ සාධක අරමුදල සඳහා මාසිකව රු. 100ක් අඩු කරගත යුතුය.

(iii) නිමල් හා කමල් පිළිවෙළින් රු. 2000ක් හා රු. 3000ක් වූ නම් නිවාස ණය වාරික අඩු කර බැංකුව වෙත කෙලින්ම ප්‍රේෂණය කරන ලෙස දන්වා ලිපි ලබා දී ඇත.

(iv) සේවක අර්ථ සාධක අරමුදලට සේවය සේවක දායකයක් පහත පරිදි අඩු කළ යුතුය.
සේවය දායකත්වය 15%, සේවක දායකත්වය 10%

අවශ්‍ය වන්නේ,

1) 2020 ජුනි මාසය සඳහා වැටුප් ලේඛනය
2) වැටුප් පාලන ගිණුම්ද ඇතුලත්ව වැටුප් ගිණුම්ගත කිරීමට අදාළ ලෙජර් ගිණුම්

(ලකුණු -5)

22 A/L අපි | papers grp |

Scanned with CamScanner

Past Papers Wiki

3. දුලනි කාලයක සිට කාන්තාවන් සඳහා සේවා සපයන රූපලාවන්‍යාගාරයක්, කුරුණෑගල ප්‍රදේශයේ පවත්වාගෙන යයි. 2020.01.01 දින වන විට ව්‍යාපාරය සතුව පැවැති වත්කම් හා වගකීම් පහත දැක්වේ.

වත්කම්	
සැලෝන් උපකරණ	රු. 900,000
රූපලාවන්‍ය නිෂ්පාදන තොග	රු. 100,000
ණයගැතියන්ගෙන් ලැබිය යුතු	රු. 350,000
අතැති මුදල	රු. 50,000
රඳවාගත් ඉපයීම්	රු. 100,000
වගකීම්	
ණය හිමියන්ට ගෙවිය යුතු	රු. 200,000

2020 ජනවාරි මාසයේදී ව්‍යාපාරය තුළ පහත ගනුදෙනු සිදු විය.

a) රූපලාවන්‍ය සේවා ලබා දීමදි භාවිතා කිරීම සඳහා ණයට මිලදී ගත් භාණ්ඩවල වටිනාකම රු. 850,000
b) මනාලියන් ඇන්ඳ වීම වෙනුවෙන් ලද මුදල රු. 150,000
c) ණයගැතියන්ගෙන් ලද මුදල රු. 125,000
d) දුලිනි රු. 560,000 අතිරේක ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට යෙදවීම
e) මනමාලියන් දෙදෙනෙකු ඇන්දවීම වෙනුවෙන් ලැබිය යුතු මුදල රු. 300,000 ක් වන අතර ඉන් රු. 200,000 ක් ජනවාරි මාසය තුළ ලැබිණි.
f) ජනවාරි මාසය සඳහා වූ විදුලි බිල රු. 20,000 ක් හා කඩ කුලිය වූ රු. 30,000ක් මුදලින් ගෙවීම
g) රූපලාවන්‍ය කටයුතු හා නිය අලංකරණ කටයුතු වෙනුවෙන් ලද මුදල රු. 75,000
h) දුලිනි නම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබාගත් මුදල රු. 40,000
i) ණය හිමියන්ට ගෙවූ මුදල රු. 390,000ක් වන අතර ලද වට්ටම රු. 10,000කි.
j) සැලෝන් උපකරණ මිලදී ගැනීම් රු. 300,000
k) සේවකයින් සඳහා 2020 ජනවාරි මාසය සඳහා ගෙවූ වැටුප් හා ගමන් වියදම් දීමනාව රු. 60,000
l) ණයගැනි ලැබීම් රු. 195,000 කි. දුන් වට්ටම රු. 5,000 කි.
m) කොණ්ඩ මොස්තර සැකසීම සඳහා මාසයට අදාළව ලැබිය යුතු මුදල රු. 480,000 ක් වූ අතර ඉන් රු. 400,000ක් ජනවාරි මාසය තුළ ලැබිණි.
n) රූපලාවන්‍ය කටයුතු සැපයීමේ අරමුණින් මිලදී ගත් භාණ්ඩවලින් රු. 350,000ක් වටිනා භාණ්ඩ 2020 ජනවාරි 31 දින වන විට ව්‍යාපාරය සතුව පැවතිණි.

අතිරේක තොරතුරු

සැලෝන් උපකරණ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත 10%ක් වාර්ෂිකව ක්ෂය කළ යුතුය.

අවශ්‍ය වන්නේ

1) ඉහත සඳහන් ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට දක්වන බලපෑම පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණය ආශ්‍රයෙන් දක්වන්න.
   රූපලාවන්‍ය උපකරණ + රූපලාවන්‍ය සේවා සැපයීම සඳහා මිලට ගත් භාණ්ඩ + ණයගැති + මුදල් = ප්‍රග්ධනය + රඳවාගත් ඉපයීම් + ණයහිමි
2) 2020 ජනවාරි 31 අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශය
3) ලාභ සමීකරණය ආශ්‍රයෙන් ව්‍යාපාරයේ ජනවාරි මස ලාභ/ අලාභ ගණනය කරන්න.
4) 2020 ජනවාරි 31 දිනට ව්‍යාපාරයේ මූල්‍ය තත්ව ප්‍රකාශනය

Scanned with CamScanner

4.

I. සිකුරු යාල හම්බන්තොට යාල වනෝද්‍යානයට යාබදව පිහිටි කාමර 10කින් යුත් අංග සම්පූර්ණ පහසුකම්වලින් යුතු සංචාරක හෝටලයකි. කොවිඩ් 19 අර්බුදය නිසා පසුගිය මාස 2ක තුළ වසා දැමුණු හෝටලය නැවත ජූනි මස මුල සිට සංචාරකයින්හට විවෘත වුණි. විදේශීය සංචාරකයින් ගෙන්වා ගැනීම දැනට රටේ පවතින තත්ත්වය නිසා අපහසු බැවින් දේශීය සංචාරකයින් ගෙන්වා ගැනීමේ අරමුණින් පහත සඳහන් වට්ටම් පහසුකම් යටතේ විශේෂ මිල ගණන්වලට කාමර පහසුකම් ලබාදෙන ලදි. පහත නොරතුරු එම හෝටලයේ ඇස්තමේන්තුගත නොරතුරු වන අතර 2020 ජූනි මාසයට අදාළ වේ.

කාමරයක් දිනකට රු. 20,000 බැගින්වූ මුදලකට ලබා දෙන අතර ආහාර හා අනෙකුත් සියලු පහසුකම් හෝටලය විසින් ලබා දේ. (Full board double room)

ජූනි මාසයට අදාළ වියදම් මෙසේය.

කෑම බීම වියදම් (දිනකට එක කාමරයක් සඳහා)	රු. 6,000
කාමරයක් සඳහා දිනකට අවශ්‍ය ද්‍රව්‍ය වියදම (amenities)	රු. 700
ඇඳ ඇතිරිලි පිරිසිදු කිරීමේ වියදම (දිනකට එක කාමරයක් සඳහා)	රු. 300
මල් සැරසිලි වියදම (දිනකට එක කාමරයක් සඳහා)	රු. 500
හොටලේ සේවක මාසික වේතනය	රු. 950,000
හොටලේ සේවක සෞඛ්‍ය රක්ෂණය මාසික වියදම	රු. 200,000
මාසික නඩත්තු වියදම	රු. 250,000
මාසික දුරකථන, අන්තර්ජාල. සැටලයිට් TV වියදම	රු. 25,000
මාසික විදුලි වියදම	රු. 450,000

අවශ්‍ය වන්නේ

1) සියලුම කාමර සංචාරකයින්ගෙන් පිරි ගියේ නම් හෝටලයේ දිනක දායකත්වය
2) සියලුම කාමර සංචාරකයින්ගෙන් පිරි ගියේ නම් හෝටලයේ වියදම් ආවරණය කර ගැනීමට යන අවම දින ගණන
3) සියලුම කාමර සංචාරකයින්ගෙන් පිරි ගියේ නම් රු. 625.000ක ලාභයක් ඉපයීමට ගත වන දින ගණන
4) මෙම විශේෂ පැකේජය සමාජ මාධ්‍ය හරහා ප්‍රචලිත කිරීමට රු. 375,000ක ප්‍රචාරණ වියදමක් ඉහත වියදම්වලට අමතරව දැරුවේ හා සියලුම කාමර සංචාරකයින්ගෙන් පිරි පැවතියේ නම් මුළු වියදම පියවා ගැනීමට යන දින ගණන
5) සියලුම කාමර සංචාරකයින්ගෙන් පිරි ගියේ නම් දින 20 කින් රු. 1,000,000ක ලාභයක් ඉපයීම සඳහා කාමරයකින් අය කළ යුතු මුදල

(ලකුණු - 10)

.22 A/L අපි [papers grp]

Scanned with CamScanner

II. සලනි, ලලනි, වලනි ලාභාලාභ 2:2:1 බෙදා ගනිමින් ස්වාභාවික මල් විකිණීමේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර 2019.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය පහත දැක්වේ.

	රු. 000	රු. 000
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට		6,000
(-) සමුච්චිත ක්ෂය		(1,500)
		4,500
ජංගම වත්කම්		
මල් තොගය	500	
ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු දෑ	800	
මුදල්	1,500	2,800
		7,300
ප්‍රාග්ධන ගිණුම් - සලනි	2,000	
ලලනි	2,000	
වලනි	1,000	5,000
ජංගම ගිණුම් - සලනි	300	
ලලනි	200	
වලනි	100	600
ජංගම නොවන වගකීම්		
10% බැංකු ණය		1,000
ජංගම වගකීම්		
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ	400	
ගෙවිය යුතු වියදම්	300	700
		7,300

අනෙකුත් නොරතුරු

(i) 2019.04.01 දින වලනි හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත් අතර අනෙකුත් හවුල්කරුවන් සම සමව ලාභාලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ විය. වලනිගේ විශ්‍රාම යාම වෙනුවෙන් ගණනය කළ කිර්තිනාමය රු. 1,000,000ක් වූ අතර එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුලින් ගැලපීමට එකඟ විය.

(ii) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මුදල් ලැබීම් හා ගෙවීම් පහත දැක්වේ.

මල් විකිණීමෙන් ලද මුදල	රු. 2,500,000
ණය ගැතියන්ගෙන් ලද මුදල	රු. 3,000,000
ණය හිමියන්ට ගෙවූ මුදල	රු. 2,500,000
ගෙවූ අනෙකුත් වියදම්	රු. 450,000
2019.10.01 මිලට ගත් ශීතකරණයේ පිරිවැය	රු. 1,000,000
ගැනිලි (හවුල්කරුවෙක් රු. 1 0,000 බැගින්)	රු. 300,000

(iii) නව හවුල් ගිවිසුම අනුව ගලපන ලද ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත 10%ක පොළියක් හා හවුල්කරුවෙකුට මාසිකව රු. 10,000ක වේතනයක් ගෙවීමකට එකඟ වී ඇත.

(iv) විශ්‍රාම ගිය හවුල්කරු වූ වලනිට ගෙවිය යුතු මුදල ණය ගිණුමකට මාරු කළ යුතු අතර ඒ සඳහා 10%ක පොළියක් ගෙවීමට එකඟ විය.

(v) රු. 20,000ක සලනිගේ පෞද්ගලික රක්ෂණ වියදමක් ව්‍යාපාරය දරා ඇති අතර ව්‍යාපාරය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ අයිතිකරුවූ ලලනිට වාර්ෂිකව රු. 160,000 ක කුලියක් ගෙවිය යුතුය.

(vi) 2020.03.31 දිනට ව්‍යාපාරය සතු ජංගම වත්කම් හා වගකීම් මෙසේය.

ණයගැති	රු. 400,000
මල් තොගය	රු. 250,000
ගෙවිය යුතු වියදම්	රු. 300,000
ණයහිමි	රු. 200,000

(vii) දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත 10%ක් ක්ෂය කළ යුතුය.

Scanned with CamScanner

අවශ්‍ය වන්නේ

1) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය (ලාභාලාභ බෙදා හැරීමද ඇතුලත්ව)
2) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්

(ලකුණු - 10)
(මුළු ලකුණු - 20)

5.

I. සදුල්ලා සහ සමාගමේ පහත දැක්වෙන සාරාංශගත මූල්‍ය වාර්තා පහත දැක්වේ.

සදුල්ලා සහ සමාගම 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ හා වෙනත් විස්තිරණ ආදායම් ප්‍රකාශය

22 A/L අපි [papers.grp]

	(රු. '000)	(රු. '000)
විකුණුම්		30,000
(-) විකුණුම් පිරිවැය		(10,000)
		20,000
(+) මෝටර්.රථ ඉවත් කිරීමේ ලාභ		1,000
පොළී ආදායම		500
(-) මෙහෙයුම් වියදම්	7,000	
ගොඩනැගිලි ක්ෂය	800	
මෝටර් රථ ක්ෂය	1,200	(9,000)
බදු පෙර ලාභය		12,500
(-) ආදායම් බදු		(2,000)
වර්ෂය සඳහා වන ලාභය		10,500
ඉඩම් ප්‍රත්‍යාගණන ලාභය		500
මුළු විස්තිරණ ආදායම		11,000

සදුල්ලා සහ සමාගම මූල්‍ය තත්ව ප්‍රකාශනය

	2019.03.31 දිනට	2020.03.31 දිනට
	(රු. '000)	(රු. '000)
ඉඩම්	10,000	10,500
ගොඩනැගිලි	12,000	15,200
මෝටර් රථ	16,000	12,800
තොග	3,000	2,000
වෙළඳ ලැබිය යුතු දෑ	4,000	5,000
මුදල්	1,000	2,100
	46,000	47,600
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	24,000	25,500
ප්‍රත්‍යාගණන සංචිත	-	500
රඳවාගත් ඉපයීම්	4,000	13,500
බැංකු ණය	4,000	4,000
වෙළඳ ගෙවිය යුතු දෑ	10,000	3,100
ගෙවිය යුතු ආදායම් බදු	4,000	1,000
	46,000	47,600

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Scanned with CamScanner

අතිරේක තොරතුරු

(i) වර්ෂය තුළ මෝටර් රථයක් රු. 9,000,000කට විකුණා ඇති අතර වර්ෂය තුළ මෝටර් රථයක් මිලදී ගෙන ඇත.
(ii) බැංකු ණය පොලි රු. 800,000ක් මෙහෙයුම් වියදම් තුළ ඇතුළත්ය.
(iii)වර්ෂය තුළ ලාභාංශ ගෙවීමක් සිදු කර ඇත.
(iv)වර්ෂය තුළ සාමාන්‍ය කොටස් නිකුත් කිරීමක් සිදු කර ඇත.
(v) සංචිත සඳහා කිසිදු මුදලක් වර්ෂය තුළදී මාරු කොට නොමැත.

අවශ්‍ය වන්නේ

1) වක්‍ර ක්‍රමය භාවිතා කරමින් 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සදුල්ල සහ සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(ලකුණු -10)

II. සදුල්ලා සහ සමාගමේ තොරතුරු ආශ්‍රයෙන් පහත සඳහන් ගිණුම්කරණ අනුපාතයන් (2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා) ගණනය කරන්න.

1) ශුද්ධ ලාභ අනුපාතය
2) ජංගම අනුපාතය
3) ක්ෂණික අනුපාතය
4) ණය හිමිකම් අනුපාතය
5) කොටසක ඉපයුම් අනුපාතය (කොටසක අගය රු. 1,000)

(ලකුණු - 05)

III. ප්‍රමෝද් සහ සමාගම තම පරණ යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිලදී ගැනීම පිළිබඳ සලකා බලමින් සිටි. පහත තොරතුරු නව යන්ත්‍රය මිලදී ගැනීම හා සම්බන්ධ වේ.

මූලික ආයෝජනය	රු. 500,000
පළමු වසරේ ශුද්ධ ලාභය	රු. 70,000
දෙවන වසරේ ශුද්ධ ලාභය	රු. 50,000
තුන්වන වසරේ ශුද්ධ ලාභය	රු. 60,000
හතරවන වසරේ ශුද්ධ ලාභය	රු. 40,000
පස්වන වසරේ ශුද්ධ අලාභය	රු. 10,000

(i) නව යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය අවුරුදු 5ක් වන අතර සුන්බුන් අගය රු. 40,000කි. නව යන්ත්‍රය මිලදී ගත්තොත් පැරණි යන්ත්‍රය රු. 30,000කට විකිණිය හැකිය.
(ii) නව යන්ත්‍ර මිලදී ගැනීම නිසා මූලික කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව රු. 50,000 සේ සිට රු. 80,000 දක්වා වැඩි වන අතර ඵලදායී ජීවකාලය අවසානයේදී සම්පූර්ණ කාරක ප්‍රාග්ධනය ප්‍රතිපූරණය කළ හැක.
(iii) 10% වට්ටම් සාධකය පහත දැක්වේ.

වර්ෂය	1	2	3	4	5
වට්ටම් සාධකය	0.909	0.826	0.751	0.683	0.621

අවශ්‍ය වන්නේ,

1) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය
2) පිළිගෙවුම් කාලය
3) ශුද්ධ වර්තමාන අගය
4) ශුද්ධ වර්තමාන අගය පදනම් කරගනිමින් යන්ත්‍රය මිලදී ගැනීම පිළිබඳ තීරණය

(ලකුණු - 05)

PAST PAPERS WIKI
Scanned with CamScanner

6.

I. නිදහස් ආර පිහිණුම්කරුවන්ගේ සංගමයේ 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම පහත දැක්වේ.

2019.01.01 ශේෂය ඉ/ගෙ	15,000	ක්‍රීඩා උපකරණ	60,000
ක්‍රීඩා උපකරණ විකුණුම්	75,000	ක්‍රීඩා උපකරණ අලෙවිහල් - ණයහිමි	30,000
අලුත් අවුරුදු උත්සවයට සඳහා එකතු කළ මුදල්	20,000	ක්‍රීඩා උපකරණ අලෙවිහල් - වැටුප්	10,000
පිහිණුම් තටාකය නවීකරණය සඳහා ලද ආධාර	100,000	අනෙකුත් වියදම්	12,500
සාමාජික මුදල්	51,000	ගමන් වියදම්	1,500
සාමාන්‍ය ආධාර	20,000	අලුත් අවුරුදු උත්සව වියදම්	5,500
ඇතුලත් වීමේ ගාස්තු	5,000	පිහිණුම් තටාක නවීකරණ වියදම්	100,000
යාවජීව සාමාජික ගාස්තු	40,000	ලිපි ද්‍රව්‍ය	2,000
		ශේෂය ප/ගෙ	104,500
	326,000		326,000

.22 A/L අලුත් papers grp

පහත සඳහන් තොරතුරු ව්‍යාපාරයේ ආරම්භක හා අවසාන වත්කම් හා වගකීම්වලට අදාළ වේ.

	01.01.2019	31.12.2019
ඉඩම් හා පිහිණුම් තටාකය	100,000	180,000
ක්‍රීඩා උපකරණ	20,000	70,000
ලැබිය යුතු සාමාජික මුදල්	8,000	5,000
ඉදිරියට ලද සාමාජික මුදල්	4,000	?
ක්‍රීඩා භාණ්ඩ අලෙවිහලේ තොගය	15,000	20,000
ක්‍රීඩා භාණ්ඩ අලෙවිහලේ ණයහිමි	5,000	20,000

<u>අනිරේක තොරතුරු</u>

(i) ක්‍රීඩා සංගමය ක්‍රීඩා භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යනු ලබන අතර සියලු විකුණුම් මුදලටත් සියලු ගෙණුම් ණයටත් සිදු කරනු ලබයි.

(ii) 2019.12.31 දිනට උපචිත ගමන් වියදම රු. 5,000කි. ගමන් වියදම් ක්‍රීඩා භාණ්ඩ අලෙවිසැලට අදාළ වේ.

(iii) යාවජීව සාමාජිකත්වය ලද සාමාජිකයන් 4 දෙනෙකුගෙන් ලද මුදල රු. 40,000ක් වන අතර එය අවුරුදු 10ක් පුරා සමානව ආදායමක් ලෙස හඳුනාගත යුතුය.

(iv) වාර්ෂික සාමාජික මුදල රු. 1,000ක් වන අතර මුළු සාමාජික ප්‍රමාණය 50කි.

(v) ක්‍රීඩා උපකරණ 2019.01.01 දින මිල්දී ගත් අතර 2019.07.01 දින පිහිණුම් තටාකය නවීකරණ කටයුතු අවසන් විය.

(vi) 2018 හා 2019 වර්ෂ සඳහා සාමාජිකයින් දෙදෙනෙකු සාමාජික මුදල් නොගෙවූ අතර ඔවුන් සාමාජිකත්වය අත්හිටුවා හිඟ සාමාජික මුදල් කපා හරින ලදි.

<u>අවශ්‍ය වන්නේ</u>

1) යාවජීව සාමාජික මුදල් ගිණුම
2) 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා භාණ්ඩ අලෙවිසැලේ ආදායම් ප්‍රකාශනය
3) 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සංගමයේ ආදායම් ප්‍රකාශනය

(ලකුණු - 10)

II. පහත සඳහන් තොරතුරු හිරුණි ලී බඩු සමාගමේ පොත්වලින් 2020.06.01 දින උපුටා ගන්නා ලදී.

ණයගැති පාලන ගිණුමේ ශේෂය	රු. 400,000
ණයහිමි පාලන ගිණුමේ ශේෂය	රු. 250,000
වෙළඳ තොගය	රු. 400,000
VAT පාලන ගිණුමේ ශේෂය	රු. 50,000 (බැර)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Scanned with CamScanner

Past Papers Wiki

පහත සඳහන් ගනුදෙනු 2020 ජූනි මාසය තුළ සිදු විය.

(i) මුදලට විකුණුම් රු. 200,000

(ii) ව්‍යාපාරයේ විකිණීම සඳහා තබා තිබූ රු. 25,000 ක් වටිනා පුටු කට්ටලයක් හසිනි විසින් තම පෞද්ගලික පරිහරණය සඳහා ලබා ගන්නා ලදී.

(iii) ණයට විකුණුම් - අනිල් රු. 250,000

(iv) මුදලට ගැණුම් රු. 100,000

(v) ණයගැති ලැබීම් රු. 270,000 (10% වට්ටමකට යටත්ව)

(vi) ණයට විකුණුම් - මනිල් රු. 200,000

(vii) රුවන්ගෙන් ණයට ගැණුම් රු. 75,000

(viii) ගෙවූ කුලී වියදම් රු. 20,000

(ix) ණයහිමි ගෙවීම රු. 240,000 ලද වට්ටම රු. 10,000

(x) සුනිල්ගෙන් ණයට ගැණුම් රු. 50,000

<u>අතිරේක තොරතුරු</u>

(i) ව්‍යාපාර 8% VAT සඳහා ලියාපදිංචි වූ සමාගමකි.

(ii) සියලු ගැණුම් හා විකුණුම්වල VAT රහිතව ඉදිරිපත් කර ඇත.

<u>අවශ්‍ය වන්නේ,</u>

1) පහත සඳහන් මූලික පොත් පිළියෙළ කිරීම

(a) මුදල් ගෙවීම් ජ'නලය

(b) විකුණුම් ජ'නලය

(c) ගැණුම් ජ'නලය

(d) පොදු ජ'නලය

2) 2020.06.30 දිනට

(a) VAT පාලන ගිණුම

(b) ණය හිමි පාලන ගිණුම

(ලකුණු - 10)

(මුළු ලකුණු - 20)

Scanned with CamScanner